සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

1 - 12 . 2016

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 08 | විෂයය / பாடம் / Subject ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper I, II | කාලය / காலம் / Time පැය 02 |

නම :- ........................................ විභාග අංකය :- ....................

සැලකිය යුතුයි:
- I කොටසේ ප්‍රශ්න වලට පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.
- II කොටසට අදාල පිළිතුරු වෙනම කඩදාසියක ලියා I කොටසට අමුණා භාර දෙන්න.

## I කොටස

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) සුබවාදී සිතුවිලි පමණක් ඇතුළත් පිළිතුර වනුයේ,
 (1) ඔව් මට පුළුවන්, හවස්වෙලා බලමු, මේ වැඩේ කල් දමමු
 (2) අද දවසම වැඩ කරමු, හෙටත් වැඩ කරමු, වැඩ කිරීම සතුටක්
 (3) හවස්වෙලා බලමු, හෙටත් වැඩ කරමු, ඔබට ජය පතමි
 (4) ඔව් මට පුළුවන්, මට හරි කම්මැලියි, ඔබට ජය පතමි

(02) ගංවතුර ඇතිවීමට බලපාන මිනිස් ක්‍රියාකාරකමක් දැක්වෙන පිළිතුර තෝරන්න.
 (1) වගුරු බිම් ගොඩකර ඉඳිකිරීම් කිරීම.
 (2) මුහුදු තීරයේ ඇති ශාක ඉවත් කිරීම.
 (3) කඳු පාමුල ඉඳිකිරීම් සිදු කිරීම.
 (4) කොරල් පර කැඞීම.

(03) "තමා තමාටම නායකයෙකු වන්න" යන ප්‍රකාශය ඉදිරිපත් කරන ලද්දේ,
 (1) හැරී. එස්. ට්‍රූමන්ය.
 (2) මහත්මා ගාන්ධි තුමාය.
 (3) බුදුරජාණන්වහන්සේ ය.
 (4) ක්‍රිස්තුස්වහන්සේ ය.

(04) ක්‍රි. ව. 1989 ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුව ළමා අයිතිවාසිකම් සුරැකීමට ක්‍රියාකරන ජාත්‍යන්තර ආයතනය වනුයේ,
 (1) යුනෙස්කෝ ආයතනය යි.
 (2) ලෝක සෞඛ්‍යය සංවිධානය යි.
 (3) යුනිසෙෆ් ආයතනය යි.
 (4) ආහාර හා කෘෂිකර්මය සංවිධානය යි.

(05) හිරු දෙවියන් උදෙසා අලුත් සහලින් කිරිබත් පිස, පූජා පවත්වා, ගවයා සඳහා කෘත ගුණ දැක්වීම සිදු කරන ආගමික උත්සවය කුමක් ද?
 (1) මහා ශිව රාත්‍රී උත්සවය
 (2) දීපවාලී උත්සවය
 (3) රාමසාන් උත්සවය
 (4) තෛපොංගල් උත්සවය

- ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

(නිර්මාණශීලී, සුඛසාධන, සංස්කෘතිය, මානසික පීඩනය, අර්ථවත්ව, අනන්‍යතාව)

(06) මානසිකව ඇතිවන වෙහෙසකාරී තත්ත්වය .................................. ලෙස හැඳින්වේ.

(07) මිනිසා තුළ හටගත් ඇතැම් ගැටුම්කාරී අවස්ථා හේතුවෙන් .................................. දේවල් බිහිවී තිබේ.

(08) අධ්‍යාපනය, සෞඛ්‍ය වැනි පොදු සේවා රජය මගින් නොමිලේ සපයනු ලබන අතර ජලය, විදුලිය වැනි සේවාවන් .................................. පදනමක් යටතේ සපයනු ලැබේ.

(09) පාරම්පරික රැකියා ක්ෂේත්‍ර තුළින් ලැබෙන නිෂ්පාදන හා සේවා රටේ ජාතික .................................. හා අභිමානයට හේතු වේ.

(10) ජන සමාජය තුළ දක්නට ලැබෙන සියලුම ලක්ෂණ මෙහෙයවන බලවේග .................................. ලෙස හැඳින්වේ.

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රකාශන නිවැරදි නම් "✓" ලකුණ ද, වැරදි නම් "×" ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

(11) ශ්‍රීමත් අයිසැක් නිව්ටන් අසූපස්වන වියේ දී ගුරුත්වාකර්ෂණ නියමය ලොවට දායාද කරන ලද්දේ සුඛවාදීව ක්‍රියාකිරීම නිසාය. ( )

(12) මැනවින් නඩත්තු නොකළ වාහන ධාවනය කිරීමෙන් මාර්ග අනතුරු වලක්වාගත හැකිය. ( )

(13) අසරණයන්ට පිහිටවීම, අන් ජාතීන්ට හා ආගම්වලට ගරු කිරීම, පරිසරය සුරකීම යන කරුණු සෑම ආගමකටම අදාල පොදු අපේක්ෂාවන්ය. ( )

(14) සමාජයේ ඇති විවිධ රැකියා හා රැකියා ක්ෂේත්‍ර සියල්ලේම එකතුව වැඩ ලෝකය ලෙස හැඳින්වේ. ( )

(15) තමාගේ ආරක්ෂාව පිළිබඳ විමසිලිමත් වීම හා අන් අයගේ ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් නොවීම ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියකු තුළ දැකගත හැකි වැදගත් ලක්ෂණයකි. ( )

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා X කොටසේ ප්‍රකාශයට වඩාත් ගැළපෙන නිවැරදි පිළිතුර Y කොටසින් තෝරා අදාළ අක්ෂරය වරහන් තුළ යොදන්න.

| X කොටස | Y කොටස |
|---|---|
| (16) ඇස් විශාලවීම, අතපය වෙව්ලීම, කෑගැසීම වැනි ශාරීරික ප්‍රතික්‍රියා ඇතිවේ. (    ) | A. ලෝක සංග්‍රාම |
| (17) ප්‍රචණ්ඩකාරී ගැටුම් නිසා මානව ඉතිහාසය තුළ ජීවිත හා දේපල විශාල වශයෙන් හානි වූ අවස්ථා (    ) | B. නායකත්ව ගුණාංග |
| (18) මිත්‍රශීලිබව, සමානාත්මතාවය හා ස්ථිරසාරබව ඇතිකර ගැනීම (    ) | C. සිසු සැරිය |
| (19) පාසල් සිසුන් සඳහා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය හා පෞද්ගලික බස් සේවා සමාගම් මගින් සපයා දී ඇති විශේෂ සේවාව (    ) | D. භයට පත්වීම |
| (20) අන්‍ය මත ඉවසමින් පවුලේ සාමාජිකයන් තුළ යහපත් සබඳතා ගොඩනගා ගැනීම (    ) | E. ප්‍රජාතන්ත්‍රීය ජීවන ක්‍රමයක ලක්ෂණයකි. |
| | F. ළමා අයිතිවාසිකම් |

(ලකුණු 20 x 2 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නයට පිළිතුරු ලිවීම අනිවාර්යය වේ. පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.

(01) ඔබ විසින් පාසලේ තුන්වන වාර අවසානයේ කරන්නට යෙදුණු "වැඩ ලෝකය පිළිබඳ තොරතුරු ගවේෂණය" කිරීම සම්බන්ධ ක්‍රියාකාරකම ආශ්‍රයෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(1) ඉහත ක්‍රියාකාරකම සැලසුම් කිරීමේ දී ගුරුතුමා/ තුමිය ඔබ කණ්ඩායමට හෝ ඔබට ලබාදුන් ගුරු උපදෙස් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(2) ඔබ/ ඔබ කණ්ඩායම විසින් තොරතුරු සොයා බලන ලද ආයතන දෙකක නම් සඳහන් කරන්න. (ලකුණු 02)

(3) ඔබ ගවේෂණයේ යෙදුණු ආයතනයේ දී ඔබට තොරතුරු සපයා ගැනීමට උදව්කල නිලධාරීන් දෙදෙනෙකුගේ නිල නාම ලියා දක්වන්න. (ලකුණු 02)

(4) මෙම ක්‍රියාකාරකම කරගෙන යාමේ දී ඔබට මතුවූ ගැටලු දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(5) ඔබ ගවේෂණය කරන ලද ආයතනය පිළිබඳ තොරතුරු සෙවූ මාතෘකා තුනක් ලියන්න. (ලකුණු 03)

(6) මෙම ක්‍රියාකාරකම කිරීමේ දී ඔබතුළ ඇති වූ සුබවාදී සිතුවිලි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(7) ඔබ විසින් මෙම ක්‍රියාකාරකම අවසානයේ සකස් කරන්නට යෙදුනු වාර්තාවේ සඳහන් වාක්‍යය තුනක් ලියා දක්වන්න. (ලකුණු 03)

(02) (1) පුද්ගලයකු තුළ ඇතිවන චිත්තවේග තත්ත්වයන් දෙකක් ලියන්න. (ලකුණු 02)


(2) පුද්ගල චිත්තවේග හිතකර අන්දමින් හසුරුවා නොගැනීම නිසා පාසල් සිසුවෙකුට විඳින්නට සිදුවන අපහසුතා හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(3) අතීත මිනිසුන් මානසික පීඩා අවම කර ගැනීමට ගත්තා ලද ක්‍රියාමාර්ග තුනක් සඳහන් කර, එයින් එක් ක්‍රියාමාර්ගයක් ක්‍රියාත්මක කළ ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)


(03) (1) සංස්කෘතිය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ දෙදෙනෙකුගේ නම් සඳහන් කරන්න. (ලකුණු 02)

(2) පහත සඳහන් A හා B රූප සටහන් වලින් දැක්වෙන්නේ ආගමික ස්ථාන දෙකකි. එම ස්ථාන දෙක හඳුනාගෙන A හා B අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A



B



(ලකුණු 04)

(3) පහත වරහන් තුළ දක්වා ඇති බහු සංස්කෘතික ජන සමාජයක ලක්ෂණ අතරින්

C. ඒකීයත්ව ලක්ෂණ (පොදු ලක්ෂණ) තුනක් ද?

D. විවිධත්ව ලක්ෂණ (වෙනස් ලක්ෂණ) දෙකක් ද තෝරා C හා D අනු පිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ සඳහන් කරන්න.

(භාෂාව, ආගම, ජීවත්වන රට, නීතිය, ජාතික උරුම) (ලකුණු 05)

(04) (1) ජීවන ගමනේ දී විවිධ අවස්ථාවල ඔබට නායකයින් හමුවී ඇත. ඒ අතරින්,

A. නිවසේ දී ඔබට හමුවන නායකයෙකු

B. පාසලේ දී ඔබට හමුවන නායකයෙකු ලියා දක්වන්න. (ලකුණු 02)

(2) පහත සඳහන් සේවාවන් ලොවට දායාද කළ උදාර නායකයින්ගේ නම් පහත වරහන් තුළින් තෝරා C, D, E, F වශයෙන් ඔබේ පිළිතුරු පත්‍රයේ සඳහන් කරන්න.

C. ඇමරිකාවේ කළු ජාතිකයින්ගේ සිවිල් අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කිරීම.

D. දකුණු අප්‍රිකාවේ වර්ණභේද වාදය පිටු දැකීම.

E. ගව ඝාතනයට එරෙහි වීම හා බුද්ධගයාව බේරා ගැනීමට කටයුතු කිරීම.

F. ශ්‍රී ලාංකික නිදහස් ව්‍යාපාරයට දායක වීම.

(D. S. සේනානායක මහතා, අනගාරික ධර්මපාල තුමා, මාටින් ලූතර් කිං මහතා, නෙල්සන් මැන්ඩෙලා මහතා, වින්සන්ට් චර්චිල් මහතා) (ලකුණු 04)

(3) ප්‍රජාතන්ත්‍රවාදී නායකයින් සතු ලක්ෂණ දෙකක් සඳහන් කර ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ශෛලිය තුළින් සමාජයට සිදුවන යහපත කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)